# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2191/25 - 2020 සැප්තැම්බර් මස 02 වැනි බදාදා - 2020.09.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උපවගන්තිය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින් 2019 දෙසැම්බර් මස 05 දිනැති 2152/32 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ 1 වැනි උපලේඛනය, එකී උපලේඛනයට මෙහි උපලේඛනයේ I හා II තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වන තීරුවේ සඳහන් වූ විස්තර යටතේ නිශ්චිතව දක්වා ඇති අයිතමයන් එකතු කිරීමෙන් 2020 සැප්තැම්බර් මස 03 සිට මෙයින් සංශෝධනය කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 02 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5136 — 570 (2020/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ස. ව. ශීර්ෂය<br>I | සංයෝජිත වර්ගීකරණ සංකේතය<br>II | විස්තරය<br>III | අනුග්‍රාහක බදු අනුප්‍රමාණය<br>IV |
|---|---|---|---|
| 84.19 | | ගෘහස්ත කාර්යයන් සඳහා පාවිච්චි කරන වර්ගයේ යන්ත්‍ර සූත්‍ර හෝ පිරියත යන්ත්‍ර හැර, රත් කිරීම, පිසීම, කර කිරීම, ආසවනය කිරීම, ශෝධනය කිරීම, ජීවාණුහරණය, පැස්චරීකරණය, හුමාල වැද්දීම, වියළීම, වාෂ්පීකරණය, වාෂ්ප තැවරීම, ඝනීභවනය හෝ සිසිල්කරණය වැනි උෂ්ණත්ව වෙනස් කිරීමේ පිළිවෙතකින්, ද්‍රව්‍ය පිළියම් කිරීම සඳහා, විදුලියෙන් රත් කරන හෝ නොකරන (85.14 ශීර්ෂයේ ඌෂ්මක, උඳුන් සහ අනෙකුත් උපකරණ හැර), යන්ත්‍ර සූත්‍ර, පිරියත යන්ත්‍ර හෝ රසායනාගාර උපකරණ) විදුලිමය නොවන ක්ෂණික හෝ සංචායක ජල තාපක. | |
| | | | |
| | | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර, පිරියත සහ උපකරණ | |
| | 8419.89.90 | අනෙකුත් | 2.5% |
| | | | |
| 84.37 | | ඇට, ධාන්‍ය හෝ වියළි රනිල එළවළු ශුද්ධ කිරීම, තේරීම හෝ වර්ග කිරීම සඳහා යන්ත්‍ර ; අනෙකුත් ගොවිපළ වර්ගයේ යන්ත්‍ර සූත්‍ර හැර, කෙටීමේ කර්මාන්තයේදී හෝ ධාන්‍ය හෝ වියළි රනිල එළවළු වල වැඩ කිරීම සඳහා භාවිතා වෙන යන්ත්‍ර සූත්‍ර. | |
| | | | |
| | 8437.90 | කොටස් | 2.5% |

10 - 139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.